චක්‍රලේඛ අංක 05/2017

CSD/ 03/ 20/ 01/ 2017
වන්දි අංශය
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
බම්බලපිටිය
2017.04.11

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියළුම අධ්‍යක්ෂවරුන්/නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන්
මූලස්ථාන අණදෙන නිලධාරි
සියළුම බලකා අණදෙන නිලධාරින් /පුහුණු කඳවුරු භාර අණදෙන නිලධාරින් සහ ව්‍යාපෘති භාර නිලධාරින්

**<u>ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගෙන් මියගිය සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ බාලවයස්කාර යැපෙන්නන්ගේ ගිණුම් නිදහස් කිරීම සම්බන්ධව</u>**

අංක අමප 93/230/067 හා 1993.11.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මරණයට පත්වූ සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ යැපෙන්නන්ට වන්දි ලබාදීම යටතේ සාමාජිකයාගේ එක් දරුවකුට රු.18750.00 ක මුදලක් බැගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කොල්ලුපිටිය දෙවන ශාඛාවේ තැන්පත් කර ඇති අතර ඔවුන්ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු එම මුදල් අදාල යැපෙන්නා වෙත නිදහස් කරනු ලබයි.

02. මෙම මුදල් නිදහස් කර ගැනීම සඳහා දුර බැහැර ප්‍රදේශවල සිට මෙම යැපෙන්නන් දිනපතාම දෙපාර්තමේන්තු මූලස්ථානය වෙත පැමිණීම ඔවුන්ට දුෂ්කර කටයුත්තක් බව නිරීක්ෂණය වේ.එබැවින් වයස අවුරුදු 18 සම්පූර්ණවූ යැපෙන්නන් අදාල බලකා මූලස්ථානය වෙත පහත සඳහන් ලිපිලේඛණ භාරදීමට කටයුතු කරන ලෙස යැපෙන්නන් දැනුවත් කල යුතු අතර අදාල ගොණුව ලැබී දින 07ක් ඇතුලත මූලස්ථානයේ වන්දි අංශයට ලබාදිය යුතු අතර අසම්පූර්ණ ගොණු භාර නොගන්නා බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

01. නිකුත්කර ඇති ලදුපත
02. මියගිය සාමාජිකයාගේ නම හා නිල අංකය
03. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපතක්
04. මුදල් නිදහස් කිරීම සඳහා ඉල්ලීම් ලිපිය (අධ්‍යක්ෂ ජනරාල් නමට)
05. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ගිණුම් අංකය (එම බැංකුවේ ගිණුමක් නොමැති නම් අදාල ප්‍රදේශයට ආසන්න ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ගිණුමක් අරඹා එහි ගිණුම් අංකය)
06. යම් හැනක නමෙහි වෙනසක් ඇත්නම් ඒ පිළිබඳව සඳහන් කර දිවුරුම් ප්‍රකාශයක්
07. බලකා අණදෙන නිලධාරීගේ නිර්දේශය

03. ඒ අනුව මින් ඉදිරියට එම යැපෙන්නන් දෙපාර්තමේන්තු මූලස්ථානය වෙත පැමිණීම අත්‍යාවශ්‍ය නොවන අතර, ගිණුම නිදහස් කර ගැනීම හදිසි අවශ්‍යතාවයක්ව ඇති අයවළුන්ට පමණක් මහජන දිනය වන බදාදා දිනයක පෙර පරිදි දෙපාර්තමේන්තු මූලස්ථානය වෙත පැමිණ ගිණුම නිදහස් කර ගැනීමට හැකි බවද දැනුවත් කරන මෙන් දන්වා සිටිමි.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
නො: 23, දුම්රියපොළ පාර,
බම්බලපිටිය, කොළඹ-04.

පිටපත - ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය